"ගුරා" ද? "ගුරුවරයා" ද?

පාසල් සිසුවියන් දාසය දෙනෙකුට පමණ ලිංගික අතවර සිදුකර, එම දර්ශන වීඩියෝගත කළ බවට චෝදනා ලබා සිටින උපකාරක පංති ගුරුවරයෙකු අත්අඩංගුවට පත්වීම පිළිබඳව, මාධ්‍ය තුළ අවධානය යොමු වී තිබිණි.

ඒ පිළිබඳව ඇතැම් රූපවාහිනී මාධ්‍ය ඔස්සේ වාර්තා වී තිබුණේ පහත අයුරිනි.

ඔබ සිතන ලෙසට, එක් සැකකරුවෙකු හැඳින්වීමට "ගුරා" වැනි යෙදුම් භාවිතා කිරීම ඔස්සේ, සමස්ත වෘත්තියකටම අපහාසයක් එල්ල නොවන්නේ ද?

ඒ අනුව, වඩාත් යෝග්‍ය භාෂා භාවිතයක් ඔස්සේ අදාළ සැකකරු හැඳින්වීම සඳහා, "ගුරා" යන්න වෙනුවට "ගුරුවරයා" යන්න වඩාත් උචිත නොවන්නේ ද?

**Ethics Eye නිරීක්ෂකයෙකු වීමට ඔබත් කැමතිද? එසේ නම්, ඔබ හඳුනාගන්නා මාධ්‍ය ආචාර ධර්ම කඩ කිරීම් අප වෙත එවන්න.

*අපගේ නිරීක්ෂණයන් WhatsApp ඔස්සේ නොමිලේ ලබා ගන්න! ඔබගේ නම සහ WhatsApp අංකය සෘජු පණිවිඩයක් (DM/inbox) හරහා අප වෙත එවා, දැන්ම Ethics Eye subscriber කෙනෙකු වන්න!

